

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය    சுதேச வைத்திய அமைச்சு    Ministry of Indigenous Medicine

# ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
# இலங்கை ஆயுர்வேத மருந்துப்பொருள் கூட்டுத்தாபனம்
# SRI LANKA AYURVEDIC DRUGS CORPORATION

## වාර්ෂික වාර්තාව
## ஆண்டறிக்கை
## ANNUAL REPORT

## 2014

දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

වාර්ෂික වාර්තාව - 2014

# වාර්ෂික වාර්තාව - 2014

## පටුන

ගරු සභාපතිතුමාගේ පණිවුඩය


| | | |
|---|---|---|
| **(01)** | අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 01 - 13 |
| **(02)** | විගණකාධිපති වාර්තාව | 14 - 21 |
| **(03)** | ගිණුම් ප්‍රතිපත්ති | 22 - 26 |
| **(04)** | මූල්‍ය තත්ත්ව ප්‍රකාශය | 27 |
| **(05)** | නිෂ්පාදන වෙළඳ හා ලාභා'ලාභ ගිණුම | 28- 29 |
| **(06)** | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 30 |
| **(07)** | ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම් ප්‍රකාශය | 31 |
| **(08)** | ගිණුම් පිළිබඳ සටහන් | 32 - 33 |

**සභාපතිතුමාගේ පණිවිඩය,**

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2014 වර්ෂයේ ප්‍රගතිය සම්බන්ධයෙන් පණිවිඩයක් ලබා දීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳ මම බෙහෙවින් සතුටට පත් වෙමි.

1969 දී ආරම්භ කළ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව මේ වන විට වසර 45ක දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියනු ලබයි. 2007 වර්ෂයේ දී ගරු ජනාධිපතිතුමා විසින් මා පත් කර එවන විට මෙම සංස්ථාව පාඩු ලබමින් පැවතිය අතර මා ඇතුළු කාර්ය මණ්ඩලයේ කැපවීම මත 2008 වර්ෂයේ සිට මේ දක්වා එය ලාභ ලබන රාජ්‍ය ආයතනයක් බවට පත් කිරීමට හැකි විය.

ගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව සහ දේශීය වෛද්‍ය ඇමති ගරු සාලින්ද දිසානායක මහතාගේ මඟ පෙන්වීම යටතේ දේශීය වෙදකම නන්වාලීම සඳහා සියළුම රජයේ ආයුර්වේද රෝහල් සහ පළාත් පාලන ආයතන මඟින් බෙදාහැරීම සඳහා නිමි ඖෂධ මහා පරිමාණ වශයෙන් නිපදවීම මෙම වර්ෂය වන විට ආරම්භ කර තිබුණි.

මෙහිදී නිෂ්පාදන සඳහා ගුණාත්මකභාවයෙන් යුතු අමුද්‍රව්‍ය සපයා ගැනීම ඇතුළු ගැටළු රාශියකට මුහුණ දීමට අපහට සිදු විය. තවද වර්ෂ කිහිපයක සිට මුහුණ දී තිබූ නිමි ඖෂධ ගබඩා කිරීමේ ගැටළුව, 2012 වර්ෂයේදී මිලදී ගන්නා ලද සියෙස්ටා ඉඩමෙහි පැවති ගොඩනැගිල්ල නවීකරණය කිරීම මඟින් විසඳා ගන්නා ලදී.

දේශීය වශයෙන් ඖෂධ සපයා ගැනීමේදී සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම මඟින් සැපයුම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කළ අතර ඒ මඟින් නව සැපයුම්කරුවන් ලියාපදිංචි වීම නිසා සැපයුම් ක්‍රියාවලිය විධිමත්ව හා කාර්යක්ෂම කිරීමට අපට හැකි විය.

දැනටම ප්‍රමාණාත්මකව බලන කළ අප නිෂ්පාදන සඳහා පවත්නා ඉල්ලුමට ප්‍රමාණවත් සැපයුමක් ලබා දීමට අපට නොහැකි වී ඇත. මේ සඳහා ප්‍රධානම හේතුව වී ඇත්තේ නිසි ධාරිතාවයෙන් යුතු යන්ත්‍රෝපකරණ නොමැති වීමයි. ඊට පිළියම් වශයෙන් මහ භාණ්ඩාගාරයෙන් ඊට අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට ප්‍රතිචාර ලෙස රු. මිලියන 50ක මුදලක් අප වෙත ලබා දී ඇත. ඒ අනුව නව යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට කරමින් පවතී.

නව යන්ත්‍ර සූත්‍ර ද යොදා ගනිමින් දේශීය වශයෙන් සොයා ගත නොහැකි සහ අපහසු ඖෂධ ආනයනය කිරීමට කටයුතු කිරීම මඟින් නිෂ්පාදන වල ගුණාත්මකභාවය ද ආරක්ෂා කර ගනිමින් ඉල්ලුමට සරිලන සැපයුමක් ලබා දී සුවපත් ජනතාවක් රටට දැයට ලබා දීම සඳහා කටයුතු කරන අතරම සේවක සුභ සිද්ධිය ද ඉහළ නංවමින් තවදුරටත් ලාභ ලබන ආයතනයක් ලෙස ඉදිරියට යෑම අප ලැබූ භාග්‍යක් ලෙස සැලකිය හැකිය.

ඩී.ඩී. සෝමවීර චන්ද්‍රසිරි

සභාපති,
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව.

# ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව - අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව - 2014 වර්ෂය

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 142 වගන්තියට අනුකූලව 2014.12.31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව දේශීය වෛද්‍ය ගරු ඇමතිතුමා වෙත ගෞරවයෙන් පිළිගන්වමි.

## (01) හැඳින්වීම

1957 අංක 49 දරණ රජයේ කාර්මික නීතිගත සංස්ථා පනත යටතේ 1969 මැයි 11 වෙනි දින අංක 14853/3 දරණ ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් නිවේදනයෙන් එවකට සිටි කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව ස්ථාපනය කරන ලදී.

## (02) දැක්ම

සෞඛ්‍ය සම්පන්න ජන සමාජයක් අරභයා දේශීය වෛද්‍ය විද්‍යාවේ අනන්‍යතාවය ආරක්ෂා කරගනිමින් ජාතික හා ජාත්‍යන්තර ඖෂධ අවශ්‍යතා උසස් ප්‍රමිතීන්ගෙන් යුතුව සපුරාලන සේවය මුල් කරගත් පුරෝගාමී ආයතනයක් වීම.

## (03) මෙහෙවර

උසස් ප්‍රමිතියකින් යුක්ත ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, පර්යේෂණ, සේවා සැපයීම හා සංරක්ෂණය තුළින් ජනතා අවශ්‍යතා සපුරාලන අතරම සේවක අභිවෘද්ධිය ඇති කිරීම සහ සමාජ සුභසාධනය ඉටු කරලමින් සෞඛ්‍ය සම්පන්න සමාජයක් අරභයා පුරෝගාමීව කටයුතු කිරීම.

## (04) ප්‍රධාන අරමුණු

**01.** ආයුර්වේද ඖෂධ වර්ග භෛසජ්‍ය ද්‍රව්‍ය සහ සකස් කළ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය කිරීමේ, විකිණීමේ සහ බෙදා හැරීමේ ව්‍යාපාරය කරගෙන යෑම.

**02.** අත්‍යවශ්‍ය ආයුර්වේද, සිද්ධ හා යුනානි (අමු හා නිෂ්පාදිත ඖෂධ යන දෙවර්ගයම) ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග ආනයනය කිරීම හා එවැනි ඖෂධ වර්ග විකිණීම හා බෙදා හැරීම.

**03.** දේශීය වශයෙන් නිපදවන අමු ආයුර්වේද ඖෂධ වර්ග මිලට ගැනීම හා එම ඖෂධ වර්ග සකස් කිරීම.

**04.** ආයුර්වේද ඖෂධ පිළිබඳව ශාස්ත්‍රීය සහ භෛසජ්ජක ද්‍රව්‍ය පර්යේෂණය කිරීම සහ එබඳු ඖෂධ වර්ග ප්‍රමිති කිරීම.

**05.** ආයුර්වේද ඖෂධාගාර පවත්වාගෙන යෑම සහ ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය ආයුර්වේද ඖෂධ වල දේශීය ඖෂධ වර්ග නිපදවීම.

**06.** ආයුර්වේද ඖෂධ වර්ග නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන පිරිසිදු එළඟිතෙල් නිපදවීමට පිරිසිදු එළකිරි ලබා ගනුවස් කිරි පට්ටි පවත්වා ගෙන යාම.

**07.** ඖෂධ වර්ග පිළියෙල කිරීම සඳහා අවශ්‍ය මී පැණි නිපදවීම හා මී මැස්සන් ඇති කිරීම හා මී මැස්සන් ඇති කිරීම ගෘහ කර්මාන්තයක් ලෙස සංවර්ධනය කිරීම.

## (05) ව්‍යාපාර ස්ථාන

### 5.1 ප්‍රධාන කාර්යාලය සහ නිෂ්පාදනාගාරය

මහරගම නාවින්න පාරේ අංක 94 දරණ ස්ථානයේ පිහිටා ඇත.

### 5.2 අලෙවි මධ්‍යස්ථාන

| | |
|---|---|
| විජේරාම (වෛද්‍ය සායනයද සමඟ) | : අංක 22, ශ්‍රී සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ. |
| මහනුවර (වෛද්‍ය සායනයද සමඟ) | : අංක 70, යටිනුවර වීදිය, මහනුවර. |
| දියතලාව | : සනානි මන්දිරය, දියතලාව |
| අනුරාධපුරය (වෛද්‍ය සායනයද සමඟ) | : අංක 561/86, මහජන පොළ පාර, නව බස් නැවතුම්පල, අනුරාධපුරය. |
| බදුල්ල | : බී 35/36, පළමු මහල, බස්නැවතුම්පොළ, බදුල්ල. |
| පාවෙන වෙළඳපල | : 178/80, බැස්ටියන් මාවත, පාවෙන වෙළඳ සංකීර්ණය, කොළඹ 02. |
| නාවින්න | : අංක 94, පරණ කොට්ටාව පාර, නාවින්න මහරගම. |
| රත්නපුර | : අංක 32, බස්නැවතුම්පොල , රත්නපුර. |
| තංගල්ල | : අංක 23, මුහුදු මාවත, තංගල්ල |
| බත්තරමුල්ල | : විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත බත්තරමුල්ල. |
| යාපනය | : අංක 61 A , නව වෙළඳ සංකීර්ණය, යාපනය. |
| ගාල්ල | : අංක 38 ,ඕල්කට් මාවත, (දංගෙදර වීදිය) ගාල්ල. |
| සෙත්සිරිපාය | : සෙත්සිරිපාය, බත්තරමුල්ල. |
| මොණරාගල | : අංක 267, වැල්ලවාය පාර, මොණරාගල. |

## (06) අධ්‍යක්ෂ මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| 1. | ඩී.ඩී. සෝමවීර චන්ද්‍රසිරි මහතා | - | සභාපති |
| 2. | වෛද්‍ය සී.ටී.බී.සේනාරත්න මහතා | - | කළමනාකාර අධ්‍යක්ෂ |
| 3. | වෛද්‍ය බී. ඒ. රත්නපාල මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 4. | ඩී.ජී.කුමාරතුංග මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 5. | ජගත් එම්. යාපා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 6. | ජේ.ඩබ්.කේ.ප්‍රේමරත්න මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 7. | වෛද්‍ය ර්.එම්.පී.බී. ඒකනායක මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික |
| 8. | ඒ.කේ. සෙනෙවිරත්න මහතා | - | භාණ්ඩාගාර නියෝජිත |

## (07) විධායක නිලධාරී මණ්ඩලය

| | | | |
|---|---|---|---|
| 1. | සභාපති | - | ඩී.ඩී. සෝමවීර චන්ද්‍රසිරි මහතා |
| 2. | කළමනාකාර අධ්‍යක්ෂ | - | වෛද්‍ය සී.ටී.බී.සේනාරත්න මහතා |
| 3. | සාමාන්‍යාධිකාරී (2013.03.25 – 2014.03.28 දක්වා) | - | එල්.එච්. තිලකරත්න මහතා |
| 4. | නිෂ්පාදනාගාර කළමනාකරු | - | කේ.ඩී.එම්. අර්ජුන චන්ද්‍රසේකර මහතා |
| 5. | අලෙවි කළමනාකරු | - | බර්නාඩ් කාරියවසම් මහතා |
| 6. | සැපයුම් කළමනාකරු | - | දීපනී චන්නිආරච්චි මිය |
| 7. | මානව සම්පත් කළමනාකරු | - | ලංකා වරකාගොඩ මෙනවිය |
| 8. | මුදල් කළමනාකරු | - | කැලුම් පතිරවසම් මහතා |
| 9. | ගණකාධිකාරී | - | ඒ.ඩී.එස්. ඩී. තෙන්නකෝන් මිය |
| 10. | වෛද්‍ය නිලධාරී (රා.ආ.) | - | පැරකුම් ඒකනායක මහතා |
| 11. | කළමනාකරු සැලසුම් (රා.ආ.) | - | සෝමා නාමසිංහ මිය |
| 12. | සහකාර තත්ත්ව පාලන කළමනාකරු | - | හේමන්ත කස්තුරිආරච්චි මහතා |
| 13. | සහකාර පිරිවැය ගණකාධිකාරී | - | වීරවිජය ගුණසේකර මහතා |
| 14. | මාණ්ඩලික සහකාර | - | ලාල් රණසිංහ මහතා |
| 15. | පරිගණක දත්ත නිලධාරී | - | සංජීව් කුමාර් මහතා |
| 16. | සහකාර ඖෂධවේදී | - | නිල්මිණී ගුණසේකර මිය |
| 17. | සහකාර ඖෂධවේදී | - | දමයන්ති කොඩිකාර මිය |
| 18. | ප්‍රධාන ගබඩා පාලක | - | සුනිල් වල්පොල මහතා |
| 19. | ප්‍රධාන ආරක්ෂක නිලධාරී | - | රංජිත් සේනාරත්න මහතා |
| 20. | ජ්‍යෙෂ්ඨ කාර්මික නිලධාරී | - | අනුර තිලකරත්න මහතා |
| 21. | නිෂ්පාදන ප්‍රවර්ධන නිලධාරී | - | ක්‍රිෂාන්තා ලියනගේ මිය |

### අභ්‍යන්තර විගණන අංශය

| | | | |
|---|---|---|---|
| 1. | අභ්‍යන්තර විගණක | - | යූ. ජයරත්න මහතා |

## <u>(08)</u> කාර්ය මණ්ඩල සංයුතිය

**2014** වර්ෂයේ සේවක මණ්ඩල සංයුතිය

| තනතුරු නාමය | කාර්යාලය | නිෂ්පාදනාගාරය | ඩිජේරාම අ.ම | නාවින්න අ.ම | මහනුවර අ.ම | දියතලාව අ.ම | බදුල්ල අ.ම | අනුරාධපුරය අ.ම | පිටකොටුව අ.ම | කෑගල්ල අ.ම | රත්නපුර අ.ම | මොණරාගල අ.ම | ගාල්ල අ.ම | සෙත්සිරිපාය අ.ම | ඉසුරුපාය අ.ම | යාපනය අ.ම | නිකවැරටිය ඔසු උයන | වෙරහැර අ.ම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| කළමනාකරුවන් | 04 | 01 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 05 |
| කණිෂ්ඨ කළමනාකරුවන් | 06 | 08 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 14 |
| කළමනාකාර සහකාර සේවා තාක්ෂණික නිලධාරීන් | 02 | 13 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 15 |
| කළමනාකාර සහකාර සේවා /තාක්ෂණික නොවන නිලධාරීන් | 32 | 20 | 01 | 01 | 01 | 01 | 01 | - | 01 | 01 | 01 | 01 | - | - | - | 01 | - | 01 | 63 |
| ප්‍රාථමික ශ්‍රේණිය අර්ධ ශිල්පීය නිලධාරීන් | - | 08 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 08 |
| ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නිලධාරීන් | - | 10 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 10 |
| ප්‍රාථමික ශ්‍රේණිය ශිල්පීය නොවන නිලධාරීන් | 11 | 117 | 03 | 03 | 01 | 01 | 01 | 02 | 01 | 01 | 01 | 01 | 02 | 02 | 02 | 01 | 01 | - | 151 |
| කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් | 01 | 04 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 05 |
| අනියම් කම්කරු / තාවකාලික කම්කරු | - | 02 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 01 | 03 |
| අනියම් පුහුණු කම්කරු (වෙනත්) | 01 | 16 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 17 |
| එකතුව | 57 | 199 | 04 | 04 | 02 | 02 | 02 | 02 | 02 | 02 | 02 | 02 | 02 | 02 | 02 | 02 | 01 | 02 | 291 |

## (09) සේවක දිරි දීමනා සහ සුබසාධනය

### සේවක දිරි ගැන්වීම්

වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවයක් සඳහා සමස්ත කාර්ය මණ්ඩලයටම පැමිණීමේ දිරි දීමනාව, නිෂ්පාදනය මත පදනම් වූ නිෂ්පාදන දිරි දීමනාව හා ඵලදායීතා දීමනාව ලබා දීම ද ඊට අමතරව වාර්ෂිකව ප්‍රසාද දීමනා හා ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීමද සිදු කෙරේ.

### සේවක සුභසාධනය

නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ඍජුව සම්බන්ධ වන සියළුම සේවකයින් හා අලෙවි මධ්‍යස්ථාන සේවකයින් සඳහා නිල ඇඳුම් ලබාදෙන අතර, සංස්ථාවේ සියළුම සේවකයින්ට උදෑසන කෙටි ආහාරයක් සමඟ තේ ලබා දෙයි. සංස්ථාවේ සියළුම සේවකයින්ට හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සඳහා තෙදිනක වාර්ෂික විනෝද චාරිකාවක් යාමට සංස්ථාවේ අනුග්‍රාහකත්වය ලබා දී ඇත. අවමංගල්‍ය අවස්ථාවලදී අවශ්‍ය ප්‍රවාහන පහසුකම් ලබා දීම ඇතුළුව අනෙකුත් පහසුකම් ලබා දී ඇත. අප්‍රේල් මස අවුරුදු උත්සවය සඳහා රු.5000ක තෑගි වවුචර් පත්‍රයක් සියළුම සේවකයින්ට ලබා දී ඇත.

**(10)** ඖෂධ නිෂ්පාදනය ඒකක වශයෙන් පහත දැක්වේ.

| | ඖෂධ නාමය | ඒකකය | 2014 වර්ෂය | 2013 වර්ෂය | 2012 වර්ෂය | 2011 වර්ෂය | 2010 වර්ෂය |
|---|---|---|---|---|---|---|---|
| 1 | අරිෂ්ට/වයින් | මි.ලී.750 | 149,196 | 130,960 | 145,552 | 140,351 | 144,356 |
| 2 | ආසව | මි.ලී.750 | 105,860 | 142,933 | 112,948 | 124,483 | 134,150 |
| 3 | ක්වාථ | මි.ලී.750 | 80,247 | 60,393 | 45,945 | 65,506 | 66,606 |
| 4 | සිරප් | මි.ලී.750 | 18,573 | 17,769 | 20,140 | 21,812 | 27,861 |
| 5 | තෙල | මි.ලී.750 | 171,392 | 163,484 | 139,847 | 147,702 | 135,248 |
| 6 | චූර්ණ | කි.ග්‍රෑ. | 24,942 | 29,225 | 45,945 | 26,092 | 30,318 |
| 7 | කල්ක/ලේහ/ලේප | කි.ග්‍රෑ. | 18,360 | 22,173 | 19,945 | 18,360 | 22,311 |
| 8 | රස | කි.ග්‍රෑ. | 2,505 | 3,122 | 1,417 | 1,618 | 1,702 |
| 9 | වටිකා/ගුගුල් | කි.ග්‍රෑ. | 10,166 | 15,233 | 9,651 | 14,422 | 10,212 |
| 10 | නව නිෂ්පාදන 01 | | | | | | |
| | (1) රණහංස රසායනය | කි.ග්‍රෑ. | - | 139 | 412 | 202 | 160 |
| | (2) ත්‍රිඵලා පෙති | කි.ග්‍රෑ. | 988 | 710 | 500 | 1,057 | 506 |
| | (3) මේදහරණී පෙති | කි.ග්‍රෑ. | 808 | 457 | 191 | 256 | 159 |
| | (4) මධුරු ධූපය | කි.ග්‍රෑ. | - | | | | |
| | (5) සුපේෂී බාම් | කි.ග්‍රෑ. | 21 | 11 | 27 | 57 | 29 |
| | (6) මධුමේහහරණී පෙති | කි.ග්‍රෑ. | - | | | | 3 |
| 11 | නව නිෂ්පාදන | | | | | | |
| | (1) තැම්බුම් හොදි | ග්‍රෑ. 05 | 226 | 151,893 | 103,680 | 95,000 | 83,600 |
| | තැම්බුම් හොදි | ග්‍රෑ. 250 | - | | 1 | | |
| | (2) පේයාව | ග්‍රෑ. 05 | 219,784 | 245,785 | 147,313 | 194,000 | 178,600 |
| | පේයාව | ග්‍රෑ. 250 | 10 | | 1 | | |
| | (3) පස් පංගුව | ග්‍රෑ. 50 | 70,556 | 44,671 | 67,924 | 44,560 | 10,880 |
| | (4) කෝමාරිකා ෂැම්පු | මි.ලී.95 | 11,802 | 723 | 8,626 | 6,263 | 5,294 |
| | (5) ඉරමුසු කුඩු | කි.ග්‍රෑ. | - | | 338 | 33 | - |
| | (6) බෙලිගැට මද කුඩු | කි.ග්‍රෑ. | - | | 560 | - | - |
| | වෙනත් නිෂ්පාදන වර්ග | | | | | - | - |
| | (1) ANTI DIABETIC HERBLE TEA 25 BAGS | පෙට්ටි | - | | 32 | - | - |
| | (2) HERBLE CURRY SOUP 5g (EEPORT) | 5g | - | | 500 | - | - |
| | (3) MIXE HERBLE TEA 1.5g /06 BAGS (EXPORT) | Nos | 3,200 | | 4,320 | - | - |
| | (4) SPICY HERBLE TEA 5g (EXPORT) | 5g | - | | 500 | - | - |
| | (5) PANTA KASAYA 60g | කි.ග්‍රෑ. | - | | 141 | - | - |

**(11)** රාජ්‍ය අංශයට සහ පෞද්ගලික වෙළඳ පොළට අලෙවි කරන ලද ඖෂධ වල වටිනාකම පහත පරිදි දැක්වේ.

(රු. දස ලක්ෂ වලින්)

| | **2014 වර්ෂය** | **2013 වර්ෂය** | **2012 වර්ෂය** | **2011 වර්ෂය** | **2010 වර්ෂය** | **2009 වර්ෂය** |
|---|---|---|---|---|---|---|
| රාජ්‍ය අංශය | 340.45 | 336.49 | 315.98 | 294.76 | 263.9 | 250.71 |
| <u>අලෙවි මධ්‍යස්ථානය</u> | | | | | | |
| විජේරාම වෙද ගෙදර | 13.30 | 10.59 | 6.54 | 6.36 | 6.52 | 6.1 |
| ජංගම අලෙවිය | 0.97 | 0.33 | 0.12 | 0.27 | | 0.32 |
| මහනුවර අලෙවි මධ්‍යස්ථානය | 7.96 | 6.22 | 6.53 | 5.37 | 4.86 | 4.93 |
| දියතලාව අලෙවි මධ්‍යස්ථානය | 5.12 | 3.05 | 3.33 | 1.94 | 3.44 | 2.42 |
| අනුරාධපුරය අලෙවි මධ්‍යස්ථානය | 3.81 | 2.00 | 1.85 | 0.98 | 1.15 | 1.42 |
| බදුල්ල අලෙවි මධ්‍යස්ථානය | 3.27 | 2.94 | 2.65 | 1.77 | 1.63 | 1.49 |
| පිටකොටුව අලෙවි මධ්‍යස්ථානය | - | 2.22 | 4.15 | 3.66 | 2.89 | 2.39 |
| නාවින්න අලෙවි මධ්‍යස්ථානය | 13.82 | 12.86 | 9.78 | 9.28 | 8.14 | 7.81 |
| අංක 008 ගබඩාව | 17.34 | 19.86 | 23.54 | 20.38 | 16.48 | 13.66 |
| රත්නපුර අලෙවි මධ්‍යස්ථානය | 18.01 | 12.46 | 9.39 | 4.74 | 3.11 | 1.88 |
| තංගල්ල අලෙවි මධ්‍යස්ථානය | 2.84 | 2.09 | 1.25 | 2.17 | 1.10 | 1.07 |
| විභාග දෙපාර්තමේන්තුව අලෙවි මධ්‍යස්ථානය | - | 0.98 | 1.02 | 1.01 | 0.75 | 0.60 |
| යාපනය අලෙවි මධ්‍යස්ථානය | 4.17 | 4.53 | 2.89 | 2.07 | 1.01 | 0.31 |
| ගාල්ල අලෙවි මධ්‍යස්ථානය | 7.93 | 5.58 | 4.65 | 3.68 | 1.04 | |
| සෙත්සිරිපාය අලෙවි මධ්‍යස්ථානය | 1.71 | 1.67 | 1.20 | 0.21 | | |
| ජනකලා කේන්ද්‍රය | 0.002 | 0.31 | 0.60 | 0.03 | | |
| මොණරාගල අලෙවි මධ්‍යස්ථානය | 1.42 | 1.27 | 0.74 | | | |
| බත්තරමුල්ල අලෙවි මධ්‍යස්ථානය | 1.17 | | | | | |
| වේරහැර අලෙවි මධ්‍යස්ථානය | 1.04 | | | | | |
| පාවෙන වෙළඳසැල අලෙවි මධ්‍යස්ථානය | 0.61 | | | | | |
| | | | | | | |
| **මුළු එකතුව** | **444.94** | **425.45** | **396.21** | **358.68** | **316.02** | **295.11** |

**(12)** ආදායම බෙදී ගිය අයුරු (ප්‍රතිශතයක් ලෙස)

| | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|---|
| විකුණුම් | 100.00 | 100.00 | 100.00 | 100.00 | 100.00 | 100.00 |
| අඩු කළා :- විකුණුම් පිරිවැය | 68.52 | 62.46 | 61.81 | 56.13 | 72.30 | 71.69 |
| දළ ලාභය | 31.48 | 37.54 | 38.19 | 43.87 | 27.70 | 28.31 |
| එකතු කළා - වෙනත් ආදායම් | 2.34 | 2.08 | 4.68 | 4.28 | 1.79 | 1.84 |
| එකතුව | 33.82 | 39.62 | 42.87 | 48.15 | 29.49 | 30.15 |
| අඩු කළා | | | | | | |
| ආයතන හා පරිපාලන වියදම් | 18.50 | 18.29 | 19.56 | 21.81 | 19.95 | 20.14 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | 10.91 | 11.65 | 9.03 | 8.60 | 6.77 | 5.78 |
| මූල්‍ය වියදම් | 1.98 | 0.64 | 0.01 | 0.10 | 1.28 | 0.26 |
| වෙනත් වියදම් | - | - | 0.62 | - | - | - |
| **මුළු වියදම** | 31.39 | 30.58 | 29.22 | 30.51 | 28.00 | 26.18 |
| **මෙහෙයුම් ලාභය** | 2.43 | 9.04 | 13.65 | 17.64 | 1.49 | 3.97 |
| එකතු කළා - පොළී ආදායම් සහ මෙහෙයුම් නොවන ආදායම් | 1.23 | 1.31 | 3.75 | 0.55 | 0.43 | 0.01 |
| බදු අඩු කිරීමට පෙර ලාභය | 3.66 | 10.35 | 17.40 | 18.19 | 1.92 | 3.98 |
| **අඩු කළා** | | | | | | |
| නිකවැරටිය ඔසු උයන අලාභය | 0.4 | 0.43 | 0.45 | 0.37 | 0.02 | - |
| **අඩු කළා** | | | | | | |
| බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන | 1.46 | 2.65 | 4.74 | 5.16 | 0.38 | 0.80 |
| **ශුද්ධ ලාභය** | **1.80** | **7.27** | **12.21** | **12.66** | **1.52** | **3.18** |

**(13)** ලාභ දායකත්වය (රු. මිලියන වලින්)

| | 2014 | 2013 | 2012 | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|---|---|
| විකුණුම් | 444.94 | 425.45 | 396.22 | 358.68 | 316.02 | 295.12 |
| අඩු කළා :- විකුණුම් පිරිවැය | 304.89 | 265.72 | 244.90 | 201.33 | 228.48 | 211.58 |
| දළ ලාභය | 140.05 | 159.73 | 151.32 | 157.35 | 87.54 | 83.54 |
| එකතු කළා - වෙනත් ආදායම් | 9.39 | 8.85 | 18.55 | 15.34 | 5.64 | 5.43 |
| මුළු ආදායම | 149.44 | 168.58 | 169.87 | 172.69 | 93.18 | 88.97 |
| අඩු කළා | | | | | | |
| ආයතන හා පරිපාලන වියදම් | 82.30 | 77.82 | 77.55 | 78.23 | 63.04 | 59.43 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | 48.55 | 49.56 | 35.80 | 30.86 | 21.39 | 17.07 |
| මූල්‍ය වියදම් | 8.81 | 9.48 | 0.07 | 0.37 | 4.03 | 0.76 |
| වෙනත් වියදම් | - | - | 2.49 | - | - | - |
| **මුළු වියදම** | 139.66 | 136.86 | 115.91 | 109.46 | 88.46 | 77.26 |
| **මෙහෙයුම් ලාභය** | 9.78 | 31.72 | 53.96 | 63.23 | 4.72 | 11.71 |
| එකතු කළා - පොළී ආදායම් | 5.46 | 6.78 | 1.45 | 0.83 | 0.57 | 0.02 |
| මෙහෙයුම් නොවන ආදායම් | 1.01 | 5.59 | 13.44 | 1.15 | 0.72 | |
| නිකවැරටිය ඔසු උයන (අලාභය) | (1.78) | (1.83) | (1.79) | (1.33) | - | - |
| බදු සඳහා වෙන්කිරීම් ප්‍රතිපාදන | (6.51) | (11.28) | (18.78) | (18.52) | (1.20) | (2.34) |
| **ශුද්ධ ලාභය** | **7.96** | **30.98** | **48.28** | **45.36** | **4.81** | **9.39** |

## (14) ඖෂධ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ලබාගැනීමේ ගැටළු

අප නිෂ්පාදන සඳහා බොහෝ අමුද්‍රව්‍ය සපයා ගනු ලබන්නේ දේශීය සැපයුම්කරුවන්ගෙන් වන අතර ඔවුන්ගෙන් බොහොමයක් දෙනා වනාන්තර ආශ්‍රයෙන් අදාළ අමුද්‍රව්‍යයන් ලබා ගනී. පවත්නා නිති රිති යටතේ මෙම සැපයුම ලබා ගැනීම ඉතා අසීරු කටයුත්තක් වන අතර එය හේතු කොටගෙන අමුද්‍රව්‍ය සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු වී ඇත. මේ සඳහා ශ්‍රී ලංකා පොලිසිය හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කොට සංස්ථාවේ සැපයුම සම්බන්ධයෙන් අදාළ නිතිරිති තරමක් දුරට හෝ ලිහිල් කර ගැනීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී. සිදුවන පාරිසරික හානිය සඳහා යම්තාක් දුරකට හෝ පිලියම් ලබා ගැනීම සඳහා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සතුව තිබූ නිකවැරටිය රන්දෙණිගම ඖසු උයන සංස්ථාවේ වියදමින් පවත්වාගෙන යයි.

## (15) සංස්ථාවේ නිෂ්පාදනාගාරය සහ ගබඩා පහසුකම් පුළුල් කිරීම

වැඩි වන ඉල්ලුම හමුවේ ඉහළ ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව සැපයුම් ලබා දීම සඳහා වසර 40ක පමණ කාලයක සිට පැවත එන නිෂ්පාදන ක්‍රම ප්‍රමාණවත් නොවේ. නවීන ලෝකයට ගැලපෙන පරිදි නව තාක්ෂණයෙන් යුතු යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමේ කටයුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව මේ වන විට ක්‍රියාත්මක වන අතර නිෂ්පාදන ධාරිතාවය වැඩි කර ගනිමින් දේශීය මෙන්ම විදේශීය වෙළඳපලට අවශ්‍ය නිමි ද්‍රව්‍ය ලබා දීම අපගේ අරමුණයි. තවද ක්ෂේත්‍රයේ පෞද්ගලික අංශය සමඟ සාර්ථක තරඟකාරිත්වයකට ද මුහුණ දීමට මේ මඟින් හැකියාව ලැබේ. භාණ්ඩාගාර අරමුදල් සහ මහජන බැංකුවෙන් ලබා ගන්නා ලද බැංකු ණය මඟින් 2012 වර්ෂයේ දී අත්පත් කරගත් පතිරගොඩ ඉඩමෙහි මේ වන විට නිමි ඖෂධ ගබඩා කරන අතර මිලදී ගනු ලබන නව යන්ත්‍ර සූත්‍ර එම ස්ථානයෙහි ස්ථාන ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

## (16) විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව 2014 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 06 ක් පවත්වා ඇති අතර, එහිදී විගණකාධිපති විසින් නිකුත් කරන ලද විගණන විමසුම්ද, අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරනු ලබන විගණන විමසුම්ද සාකච්ඡා කර එහි දක්වා ඇති කරුණු නිවැරදි කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් සිදුකරනු ලැබේ. මෙයට අමතරව දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශ මට්ටමින් විගණන හා කළමනාකරණ රැස්වීම් මාස 03 කට වරක් පවත්වන අතර, එහිදී විගණන විමසුම් වලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියද සලකා බලන ලදී.

2014 වර්ෂයේ සංස්ථාවේ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජික මණ්ඩලයේ විස්තර පහත දැක්වේ.

| | | | | |
|---|---|---|---|---|
| ඒ.කේ.සෙනෙවිරත්න මහතා | - | භාණ්ඩාගාර නියෝජිත | - | කමිටු සභාපති |
| ඩී.ජී.කුමාරතුංග මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | - | කමිටු සාමාජික |
| ජගත් එම්. යාපා මහතා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | - | කමිටු සාමාජික |
| ජේ.ඩබ්.කේ.ප්‍රේමරත්න මයා | - | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | - | කමිටු සාමාජික |
| ඩබ්.ඒ.සී.එස්. ප්‍රියදර්ශනී මිය | - | අමාත්‍යාංශ අභ්‍යන්තර විගණක | - | කමිටු සාමාජික |
| එස්.ඒ.ඩී.එන්. පෙරේරා මිය | - | විගණන අධිකාරි | - | කමිටු නිරීක්ෂක |
| යූ. ජයරත්න මහතා | - | අභ්‍යන්තර විගණක | - | කැඳවුම්කරු/කමිටු ලේකම් |

## (17) මූල්‍ය කළමනාකරණය හා විගණන විමසුම් පිළිබඳ අදහස්

සංස්ථාවේ ගිණුම් පද්ධතිය තුළ පවතින විවිධ අඩුපාඩු හා පද්ධති දුර්වලතා පිළිබඳව විගණකාධිපති විසින් වරින් වර විගණන විමසුම් වලින් පෙන්වා දෙනු ලැබේ. මෙයට අමතරව පාර්ලිමේන්තු පොදු කාරක සභාවේද එම අඩුපාඩු පෙන්වා දුන් අතර, දැනටමත් එම අඩුපාඩු හා දුර්වලතා විගණන හා කළමනාකරණ කමිටුව විසින් දෙනු ලබන උපදෙස් හා මඟපෙන්වීම අනුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග පරිදි අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට 2014 වර්ෂයේදී ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වා සිටිමි.

ස්තුතියි.

- නිවැරදි මඟපෙන්වීමක් කළ දේශීය වෛද්‍ය ගරු සාලින්ද දිසානායක අමාත්‍යතුමාටත්, වී.බී.පී.කේ.වීරසිංහ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත්
- සංස්ථාවේ ප්‍රාග්ධන හා අයභාර වැඩිදියුණු කිරීම සඳහා සහාය දුන් මහාභාණ්ඩාගාරයටත්
- නොමඳ සහාය ලබාදුන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වත්මන් ආයුර්වේද කොමසාරිස් ඇතුළු කාර්ය මණ්ඩලයටත් ආයුර්වේද පර්යේෂණායතනයේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- නිමි ඖෂධ මිලදී ගැනීමට සහාය දැක්වූ පළාත් සභා, පළාත්පාලන සහ ප්‍රාදේශීය සභා මෙන්ම අලෙවි නියෝජිතයින්ටත්,
- පද්ධති පාලනයේ දුර්වලතා හා වැරදි අත්හැරීම් නිවැරදි කර ගැනීමට මඟපෙන්වීමක් කළ විගණකාධිපති ඇතුළු කාර්ය මණ්ඩලයටත්,
- සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ කටයුතු ඉදිරියට ගෙනයාම සඳහා ප්‍රශංසනීය සහයෝගයක් ලබාදුන් සංස්ථාවේ කළමනාකාරීත්වයට හා සේවක මණ්ඩලයටත් මාගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනමමි.

(ඩී.ඩී. සෝමවීර චන්ද්‍රසිරි)
සභාපති
ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

මගේ අංකය / எனது இல. / My No. } එච්එස්එම්/සී/ඒඩීසී/1/14/32 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 ජුනි දින

සභාපති,

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව.

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ සභාපති වෙත 2016 ජනවාරි 29 දින නිකුත් කරන ලදී.

**1.2** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3** **විගණකගේ වගකීම**

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4** **මතය ව්‍යාචනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකිවිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.97,128,534 ක්වූ දේපල පිරියත හා උපකරණ තවදුරටත් සංස්ථාවේ කටයුතු සඳහා උපයෝජනය කරමින් පැවතියද වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20

2011 දෙසැම්බර් 31 දින වන විට භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.129,038,210 ක් වූ රජයේ ප්‍රදානවලින් මිලදී ගත් වත්කම් හඳුනාගෙන ක්‍රමක්ෂය ගැලපීම් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවක පාරිතෝෂිත ගණනය කිරීමේ දෝෂ හේතුවෙන් පාරිතෝෂිත වෙනුවෙන් රු.269,372 ක් වැඩියෙන් වෙන්කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අලෙවි මධ්‍යස්ථාන 14ක පිරිවැය රු.15,715,396 ක් වූ තොග ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ නොවන රු.934,971 ක්වූ ගොඩනැගිලි ක්ෂය නිෂ්පාදන පොදු කාර්ය වියදමක් ලෙස ගිණුම් ගත කර තිබීම නිසා එම ප්‍රමාණයෙන් වර්ෂයේ නිෂ්පාදන පිරිවැය වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සංස්ථාව විසින් ආනයනය කර තිබූ බෙහෙත් ඇඹරුම් යන්ත්‍ර 2 ට අදාළ රු.236,861 ක් වූ රඳවුම් මුදල් ගිණුම්ගත කර නොතිබුණි.

**2.2.3** <u>පැහැදිලි නොකළ වෙනස්කම්</u>

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| ගිණුමේ නම | ලෙජර් ගිණුම් අනුව ශේෂය | උපලේඛන / ශේෂ සනාථ සහතික අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| <u>සේවක ණය</u> | | | |
| 2014 /01/01 දිනට ශේෂය | 17,959,786 | 16, 994,098 | 965,688 |
| වර්ෂය තුළ ණය ගෙවීම් | 12,437,834 | 12,621,963 | 184,129 |
| වර්ෂය තුළ අයකරගත් ණය | 13,009,338 | 12,245,510 | 763,828 |
| ලංකා බැංකු නිවේදන තැන්පතු | 12,176,712 | 12,086,301 | 90,411 |
| ලංකා බැංකු ස්ථාවර තැන්පතු | 1,630,151 | 1,708,914 | 78,763. |

**2.2.4** <u>ලැබිය යුතු ගිණුම්</u>

2010 වර්ෂයේ දී ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණු රු.750,797 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**2.2.5** <u>**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**</u>

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම . |
|---|---|---|
| (අ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | එකතුව රු.166,665,142 ක්වූ දේපළ පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙළ කර නොතිබුණි. |
| (ආ) | 2014 නොවැම්බර් 21 දිනැති අංක 05/2014 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.3 වගන්තිය | ප්‍රසාද දීමනා ගෙවීම සඳහා වාර්ෂික ගිණුම් නියමිත දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවද, ඊට පටහැනිව සමාලෝචිත වර්ෂයේ ගිණුම් 2015 නොවැම්බර් 20 දින ඉදිරිපත් කර තිබියදී 2014 දෙසැම්බර් 23 දින ප්‍රසාද දීමනා ලෙස රු.3,423,640 ක් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.14,474,024ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.42,255,668 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.27,781,644 කින් පිරිහී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව වෙනත් ආදායම් රු.3,989,587 කින් අඩුවීම හා වර්ෂයේ අවසන් නිමි තොගය රු.15,715,396 කින් අඩුවෙන් ගිණුම්ගත කිරීම සහ මූල්‍ය වියදම රු.645,336 කින් වැඩිවීම ඊට හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1. කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සංශෝධිත වාර්ෂික නිෂ්පාදන සැලැස්මෙහි සැලසුම්ගත වාර්ෂික ඖෂධ නිෂ්පාදනයේ වටිනාකම රු.423,866,006 ක් වුවද තථ්‍ය වාර්ෂික නිෂ්පාදනයේ වටිනාකම රු. 268,987,152 ක් වූයෙන් අපේක්ෂිත වාර්ෂික නිෂ්පාදනය රු.154,878,854 කින් හෙවත් සියයට 36.5 කින් අඩුවී තිබුණි. යථාර්තයක් බවට පත් කර ගත හැකි සැළසුම් පිළියෙල නොකිරීම, අවශ්‍ය අමු හා වියලි ඖෂධ සපයා ගැනීම සඳහා සුදුසු හා ප්‍රමාණවත් වැඩ පිළිවෙලක් හඳුනාගෙන නිෂ්පාදන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ කටයුතු නොකිරීම මේ සඳහා බලපා තිබුණි.

(ආ) සැළසුම්ගත ඖෂධ අලෙවි වටිනාකම්, තථ්‍ය අලෙවි වටිනාකම් සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ රාජ්‍ය අංශයේ ආදායම පිළිවෙලින් සියයට 27 ක් හා සියයට 15 ක් ළඟාකර ගත නොහැකිවී තිබුණි. පෞද්ගලික අංශයේ ආදායම සැළසුම්ගත අලෙවි ආදායමෙන් සියයට 12 කින් ඉකුත් වර්ෂයේ දී වැඩිවී තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී ළඟාකර ගත නොහැකිවී තිබුණු ආදායම සියයට 33 ක්වී තිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නවදිල්ලි නුවර ලෝක සෞඛ්‍ය සංවිධාන කාර්යාලය තුළ දේශීය වෛද්‍ය කටයුතු සඳහා කාර්යාලයක් ලබා ගෙන අළුත්වැඩියාව හා කාර්යාල උපකරණ මිලදී ගැනීම සඳහා 2012 ඔක්තෝබර් 15 දින විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත රු. 3,000,000 ක අත්තිකාරමක් ලබාදී තිබුණි. අත්තිකාරම් ලබාදී වර්ෂ 2 ක් ගතවී ඇතත්, අදාල කාර්ය ඉටුකර නොතිබුණු අතර සංස්ථාව විසින් අත්පත් කර ගැනීම, අළුත්වැඩියා සිදුකිරීම හා කාර්යාල උපකරණ මිලදී ගැනීම පිළිබඳ පසු විපරම් කර අදාළ කටයුත්ත ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ආ) රජයේ බැංකුවක පවත්වාගෙන යන ජංගම ගිණුමකට අදාළ 2014 දෙසැම්බර් 31 දිනට වූ බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව, වර්ෂ 20 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොවූ තැන්පතු රු.337,010 ක් විය. ඉන් රු.22,450 ක් තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල් ලෙසද, රු.16,633 ක් 1988 හා 1992 දක්වා කාල පරිච්ඡේදය තුළ බැංකු ගත නොකළ මුදල් ලෙසද, රු.297,927 ක් පෙර සිට පැවත එන වෙනස්කම් ලෙසද හඳුනාගෙන තිබුණි. මෙවැනි තත්ත්වයක් මගින් මූල්‍ය අක්‍රමිකතා සිදුවී ඇතිබව පෙන්නුම් කෙරෙන නමුත් එයට අදාළ නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොමැති බව පෙනීයයි.

(ඈ) 2014 ජනවාරි 25 දින සංස්ථාව වෙත ලැබී තිබුණු පිරිවැය රු.2,917,801 ක් වූ ඇඹරුම් යන්ත්‍ර 2 ක් සවිකිරීම සඳහා සුදුසු වේදිකාවක් ඉදි නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් යන්ත්‍ර 2 උපයෝජනය කර නොතිබුණි.මෙම යන්ත්‍ර දෙක 2015 මාර්තු සිට උපයෝජනය කර තිබුණු නමුත් එදින වන විට වර්ෂ 02 ක් වූ වගකීම් සහතිකය මාස 13කින් කල් ඉකුත්වී තිබුණි.

(ඈ) ඇඹරුම් යන්ත්‍රවල යෝග්‍යතාව පරීක්ෂා කිරීමකින් තොරව නිෂ්පාදනය කරන ලද පිරිවැය රු.92,430 ක් වූ දෙසදුන් කල්ක කි.ග්‍රෑ.163.300 ට කුඩා ලෝහ කැබලි කිහිපයක් මිශ්‍රවී තිබීමෙන් අලෙවියෙන් ඉවත් කර තිබුණි.

(ඉ) සංස්ථාව විසින් භුක්ති විඳින ඉඩමක 2009 වර්ෂයේදී රු.1,808,795 ක් වැය කර ආරක්ෂිත වැටක් ඉදිකර තිබුණු අතර නිෂ්පාදනාගාරයක් ඉදිකිරීමට යෝජිත මෙම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඊ) 2009 වර්ෂයේ සිට හඳුනානොගත් රු.38,613,358 ක බැර ශේෂය හඳුනා ගැනීමකින් තොරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිගින් දිගටම සංචිතයක් ලෙස හෙළිදරව් කර තිබුණි.

**4.3** <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>
පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී කොටුව දුම්රිය ස්ථානය හා සෙත්සිරිපාය අලෙවි මධ්‍යස්ථාන 02 කින් ලැබී තිබුණු මුළු අලාභය රු.623,093 ක් විය.

(ආ) පොල්තෙල්වල ඇසිඩ් අගය නියමිත ප්‍රමාණයට නොවූ බැවින් තත්ත්ව පාලන කළමණාකරු විසින් ප්‍රතික්ෂේප කර තිබියදී රු.476,000 කට පොල්තෙල් කිලෝග්‍රෑම් 2,000ක් මිලදී ගෙන තිබුණි.

(ඇ) විධිමත් ගිවිසුමකට එළඹීමකින් තොරව රු.950,000 ක්වූ මූලික ගෙවීමෙන් අඩක් එනම් රු.475,000 ක් ගෙවා පිටකොටුව පාවෙන වෙළෙඳ සංකීර්ණයේ වෙළෙඳ කුටියක් කුලියට ගෙන 2014 අගෝස්තු 28 දින වෙළෙඳ කුටිය විවෘත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.42,481 ක ලාභයක් උපයා තිබියදී අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියකින් තොරව සංස්ථාවේ සභාපති විසින් වෙළෙඳ කුටිය අලාභ ලබන වෙළෙඳ කුටියක් සේ සළකා 2015 පෙබරවාරි මාසයේ වසා දමා තිබුණි.

(ඈ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යාල පරිශ්‍රයේ 2013 අප්‍රේල් මාසයේ විවෘත කරන ලද සංස්ථා අලෙවි මධ්‍යස්ථානයෙන් එම වර්ෂයේ මාස 08 ක් තුළ රු.277,132 ක අලාභ ලබා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.270,221 ක ලාභ ලබා තිබියදී අලෙවි ආදායම් වර්ධනය කර ගැනීමට ප්‍රමාණවත් පියවර ගැනීමකින් තොරව 2015 ජුනි 17 දින සිට මෙම අලෙවිසැල වසා දැමීමට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) 2007 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වාවූ ඒ ඒ වර්ෂවලදී වාර්ෂික තොග සමීක්ෂණ මගින් හඳුනාගෙන තිබුණු රු.9,782,418 ක අතිරික්ත තොග පොත් වලට ගැනීමටත් රු.6,616,750 ක තොග ඌනතා සම්බන්ධව මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණු ඖෂධ වර්ග 10 ක් නිෂ්පාදනය කර නොතිබුණු අතර නිෂ්පාදනය නොකිරීමට හේතු සහ එමනිසා සංස්ථාවට අහිමිවූ ආදායම පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළදී සුරාවිදූරවටී, ජීවානන්ද වටී, බුද්ධරාජ කල්කය, වෙල්ලවෙන්ගායම් ලේහ, රණහංස සායනය, මාකවිදූරංග, බදිරාරිෂ්ටය, මහාසංඛ වටී, සර්පගන්ධ වටී, හිංගුවාෂ්ඨක චූර්නය, වාසක සිරප් හා සොමනාථරස යන ඖෂධ වර්ග 12 ක් සඳහා ලැබී තිබුණු ඇණවුම්වලට සැපයීම සිදුකිරීමට අපොහොසත්වීම හේතුවෙන් අහිමිවී තිබුණු ආදායම රු.137,154,983 ක් විය.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

සියෙස්ටා ගබඩා සංකීර්ණයේ ස්ථාපිත කොට තිබුණු භාණ්ඩ සම්බන්ධයෙන් සිදුකළ භෞතික පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නිමි ඖෂධ ගබඩාවේ අබලි ද්‍රව්‍ය,බෝතල් කොටස් හා අලෙවි මධ්‍යස්ථාන වලින් ඉවත් කරන ලද සවිකිරීම් ද්‍රව්‍ය, ඇඹරුම් යන්ත්‍ර 02 ක් සහ වටිනාකම රු.156,000 ක්වූ ටැංකි 04 ක් ගබඩාකර තිබුණි.

(ආ) වටිනාකම හඳුනාගත නොහැකි යතුරු පැදියක් භාවිතයෙන් තොරව ගබඩා සංකීර්ණයේ තබා තිබුණි.

## 4.5 ආර්ථික නොවූ ගනුදෙනු

දිරි දීමනා ගෙවීමේදී මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු බවට 2007 නොවැම්බර් 09 දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නියෝගයක් නිකුත් කර තිබුණුද 2014 දෙසැම්බර් 31 දින වන විටත් එම අනුමැතිය ලබාගෙන නොතිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේදී හා පසුගිය වර්ෂ තුනකදී එකතුව රු. 167,552,388 ක් දිරිදීමනා ලෙස ගෙවා තිබුණි.

## 4.6 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී මෝටර් රථයක් අනතුරට පත්වීමෙන් රු.780,558 ක අලාභයක් සිදුවී තිබුණු අතර මුළු තක්සේරු වටිනාකමට වාහනය රක්ෂණය කර නොතිබීම හේතුවෙන්, රු.405,287 ක මුදලක් රක්ෂණයෙන් ආවරණයවී නොතිබුණි. මෙම අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 102 හා 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී පොලිසිය විසින් භාරදී තිබුණු කංසා කිලෝ ග්‍රෑම් 218.322 ක් අධීක්ෂණ නිලධාරියෙකු යටතේ සංස්ථාවට ප්‍රවාහනය කරන අතරතුරදී ඉන් කිලෝ ග්‍රෑම් 15.472 ක් අස්ථාන ගතවී තිබුණි. මෙම අක්‍රමිකතාවය සිදුවී වර්ෂ තුනකට ආසන්න කාලයක් ගතවී තිබුණද, මූලික පරීක්ෂණය පමණක් සිදුකර තිබූ අතර මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ගාල්ල අලෙවි මධ්‍යස්ථානයේ රාක්කයක් කඩා වැටීම නිසා රු.141,895ක ඖෂධ විනාශවී තිබුණි.

(ඈ) නිෂ්පාදනය කරන ලද රු.169,080ක් වටිනා මධූකා පැණි ලීටර 600 ක් සේවක නොසැළකිලිමත්කම හේතුවෙන් ද වටිනාකම රු.1,513,456 ක් වූ වියලි මිදි කිලෝග්‍රෑම් 2,230 ක් දූමකරණය නොකිරීම හේතුවෙන් සහ වටිනාකම රු.111,785 ක් වූ ඖෂධ වර්ග කිහිපයක පුස් බැඳීම නිසා භාවිතයට ගත නොහැකිව විනාශවී තිබුණි.,

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය හා 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යවස්ථාපිත මණ්ඩලවල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2014 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන මාස 08 ක් හා දින 20 ක ප්‍රමාදයක් සහිතව එනම් 2015 නොවැම්බර් 20 දින ඉදිරිපත් කර තිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය අතර කාලය සඳහා පිළියෙල කර තිබුණු නව සංයුක්ත සැලැස්ම තුළ හඳුනාගෙන තිබුණු දීර්ඝකාලීන අභිමතාර්ථ ඉටුකර ගැනීමට හැකිවන ලෙස, සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණු නමුත් සමාලෝචිත වර්ෂයේදී ඉටුකර ගැනීමට සැලසුම් කර තිබුණු ප්‍රාග්ධන ව්‍යාපෘති 09 කින් 07 ක් ඉටුකරගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අපේක්ෂිත නිෂ්පාදන පිරිවැය රු.423,866,006 ක් වූ අතර තථ්‍ය නිෂ්පාදන පිරිවැය රු.268,911,820 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුළදී හඳුන්වාදුන් නව නිෂ්පාදන වර්ග 10 ක් සියයට 96 කින් සහ වෙනත් නිෂ්පාදන වර්ග 07 ක් සියයට 52 සිට සියයට 72 දක්වා පරාසය තුළ ළගාකර ගැනීමට නොහැකිවී තිබුණු අතර ඒ සඳහා බලපාන ලද හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

සංස්ථාවේ 2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2016 ජනවාරි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති නමුත් මෙතෙක් නිවැරදි කිරීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු අවස්ථා පහත දැක්වේ.

(අ) අවශ්‍යතාවය හඳුනා ගැනීමකින් තොරව 2011 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු වයින් බෝතල් හා කිරල මූඩි වලින් 2013 දෙසැම්බර් 31 වන විට, වටිනාකම රු.989,603ක් වූ වයින් බෝතල් 24,002ක් හා වටිනාකම රු.623,000 ක්වූ කිරල මූඩි 28,000 ක් ගබඩාවෙහි ඉතිරිවී තිබුණි.

(ආ) රසායනාගාර වාර්තාව සහ වෛද්‍ය කමිටු වාර්තාව මගින් ප්‍රතික්ෂේපවී තිබියදී රු.1,980,000ක් වටිනා මී පැණි කිලෝග්‍රෑම් 4,000ක් 2012 ජුනි මාසයේදී පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණු අතර මෙම මිලදී ගැනීම් සම්බන්ධ වවුචර්, ලදුපත් හා අදාළ ලිපි ගොණු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) සංස්ථාව තුළ රු.5,930,284ක වියදමින් නිෂ්පාදනය කළ හැකිව තිබුණු අඟුක හෂ්ම හා නාග හෂ්ම කිලෝග්‍රෑම් 200 ක් රු.7,137,130 ක් වැය කර ආනයනය කිරීම නිසා රු.1,206,846ක පාඩුවක් සිදු වී තිබුණි.

(ඇ) සංස්ථාවේ නිවාඩු සංග්‍රහයේ 8.2 වගන්තිය අනුව පත්වීම ලද පළමු වර්ෂයේදී වෛද්‍ය නිවාඩු සඳහා හිමිකමක් නොතිබියදී නිලධාරීන් හා සේවකයන්ගේ පළමු වර්ෂයේදී ඉතිරි කරන ලද වෛද්‍ය නිවාඩු සඳහා 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා එකතුව රු.15,064,122 ක් ගෙවා තිබුණි.

(ඉ) සේවක නොසැළකිලිමත්කම හේතුවෙන් වැඩපත් අංක 01283115 යටතේ නිෂ්පාදනය කර තිබුණු රු.233,400ක් වටිනා මධූකා පැණි විනාශ වී තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) තොග පාලනය

(ආ) විකුණුම් පාලනය

(ඇ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

එච්.එම්.ගාමිණි විජේසිංහ

විගණකාධිපති.

## ගිණුම් පිළියෙළ කිරීමේ පදනම සහ ගිණුම් ප්‍රතිපත්ති - 2014

### 1. අනුකූලතා ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ස්කන්ධ වෙනස් වීම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන්, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් පළ කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි වලට අනුකූලව පිළියෙල කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 නොවැම්බර් 09 දින මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමැතිය ලබා දෙන ලදී.

### 2. මිනුම් පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි සඳහන් පහත දැක්වෙන ප්‍රමාණාත්මක අයිතමයන් හැරුණු කොට මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම් කරගෙන පිළියෙළ කර ඇත.

(අ) නිර්වචිත ප්‍රතිලාභ බැඳීම්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි නිර්දේශ කර ඇති ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය පදනම් කරගෙන ඒවායේ වර්තමානය අගය යටතේ පෙන්වා ඇත.

(ආ) ව්‍යුත්පන්න නොවන මූල්‍ය සාධන පත්‍ර ඒවායේ සාධාරණ වටිනාකම යටතේ දක්වා ඇත.

මූල්‍ය ප්‍රකාශනයන්හි උද්ධමන සාධකය සඳහා කිසිදු ගැලපුමක් කර නොමැත.

### 3. අඛණ්ඩ පැවැත්ම

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවෙහි නුදුරු අනාගතයේ අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තක්සේරු කර ඇති අතර සංස්ථාව ඇවර කිරීමක් හෝ වෙළඳාම නතර කිරීමක් අපේක්ෂා නොකරයි.

### 4. සංසන්දනාත්මක තොරතුරු

මූල්‍ය ප්‍රකාශන වඩා හොඳින් ඉදිරිපත් කිරීමට සහ ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමට හැකි වන සේ අවශ්‍ය අවස්ථාවන්හිදී පෙර වර්ෂවල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම වෙනස් කර යලි වර්ගීකරණය කර ඇත.

## 5. ඇස්තමේන්තු හා විනිශ්චයන් යොදා ගැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති හා අනුකූල වන සේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණයන්ට බලපාන විවිධ විනිශ්චය, උපකල්පන සහ ඇස්තමේන්තු, කළමනාකරණය විසින් සිදු කිරීම අවශ්‍ය වේ.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු, පෙර අත්දැකීම්, උපනති සහ පවතින තත්ත්වයන් යටතේ සාධාරණ යයි විශ්වාස කරනු ලබන අනාගත සිදුවීම් පදනම් කරගෙන කරනු ලබයි. ඒ අනුව සත්‍ය ප්‍රතිඵලය, විනිශ්චය සහ ඇස්තමේන්තුවට වඩා වෙනස් විය හැක.

ඇස්තමේන්තු සහ අදාළ උපකල්පන වල වලංගුභාවය නිරන්තරයෙන් පුනරීක්ෂණය කරනු ලබයි. යම් කාලපරිච්ඡේදයකට අදාළ ගිණුම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කර ඇත්නම් ප්‍රතිශෝධනය කළ කාලපරිච්ඡේදයට සහ බලපැවැත්වෙන ඉදිරි කාලපරිච්ඡේද වලට අදාළව එම වෙනස්කම හඳුනා ගෙන ඇත. ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව ගිණුම් පිළියෙළ කිරීමේදී තීරණාත්මක විනිශ්චයන් මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත් ප්‍රමාණයන්ට වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති කර ඇත්තේ පහත දැක්වෙන ගණනයන් කෙරෙහිය.

නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් මිණුම්කරණය

විලම්බිත බදු සම්බන්ධ වත්කම් සහ වගකීම් ගණනය

## 6. විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු

(අ) ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්

සංස්ථාවෙහි මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් අයිතම, අස්තිත්වය ක්‍රියාකරන ප්‍රාථමික ආර්ථික පරිසරයෙහි ව්‍යවහාර මුදලින් (ක්‍රියාකාරී ව්‍යවහාර මුදල) දක්වා ඇත.

(ආ) ගනුදෙනු සහ ශේෂ

විදේශ මුදල් ගනුදෙනු, ක්‍රියාකාරී ව්‍යවහාර මුදලට පරිවර්තනය කර ඇත්තේ ගනුදෙනු සිදුවන දිනයන්හි පැවති විනිමය අනුපාත උපයෝගී කර ගනිමිනි.

## 7. වත්කම් සහ ඒවායේ තක්සේරු කරන පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ මුදල්, බැංකු ශේෂයන් සහ සංස්ථාවේ සාමාන්‍ය ව්‍යාපාර චක්‍රය තුළ මුදල් බවට පත් කර ගැනීමට අපේක්ෂා කරන වත්කම්ය. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට වැඩි කාලයක් සංස්ථාව විසින් රඳවා ගැනීමට අපේක්ෂා කරයි.

### 7.1 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ,පිරියත සහ උපකරණ වටිනාකම ලෙස දක්වා ඇත්තේ ඒවායේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ හානිකරන අලාභයක් ඇත්නම් එයද අඩු කළ පසු වටිනාකමයි. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 01, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මුල්වරට සම්මත කර ගැනීම, හි සඳහන් පරිදි දේපළ, පිරියත සහ උපකරණ වල සාධාරණ වටිනාකම සංක්‍රාන්ති වන දිනයේ සලකනු ලබන පිරිවැය ලෙස පෙන්වීමට ඇති වෛකල්පික නිදහස්වීම සංස්ථාව විසින් තෝරා ගන්නා ලදී.

දේපළ, පිරියත සහ උපකරණ යටතේ දක්වා ඇති අයිතමයන්ගේ පිරිවැයට ගැණුම් මිල සහ ඒවා භාවිතා කළ හැකි තත්ත්වයට ගෙන ඒමට වැය කළ සෘජු වියදම් ඇත්නම් ඒවාද ඇතුළත් වේ.

බැහැර කරන ලද දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන්ගේ ලාභය හෝ අලාභය තීරණය කර ඇත්තේ බැහැර කිරීමෙන් ලැබෙන උත්පාදන සහ දේපළ, පිරියත සහ උපකරණ වල ධාරණ අගය අතර වෙනසින් වන අතර එය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ අනෙකුත් ආදායම් හෝ වියදම් යටතේ දක්වා ඇත.

### 7.2 ක්ෂය

ක්ෂය ගණනය කරනු ලබන්නේ ක්ෂය කළ හැකි අගය මතය. එනම් වත්කමක පිරිවැයෙන් හෝ පිරිවැය වෙනුවට ආදේශිත වෙනත් අගයකින් එහි අවශේෂ වටිනාකම අඩු කළ විට ලැබෙන අගය මතය. මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය හඳුනා ගනු ලබන්නේ සරල මාර්ග ක්‍රමයට දේපළ, පිරියත සහ උපකරණ වල එක් එක් කොටසට අයත් අයිතමයන්ගේ ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාය.
ප්‍රවර්තන කාලපරිච්ඡේදයට හා සසඳන කාලපරිච්ඡේදයන්ට අදාළ අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීවිත කාල සහ ක්ෂය අනුපාතික පහත දැක්වේ.

| වත්කම් වර්ගය | ප්‍රයෝජනවත් ජීවිත කාලය (අවුරුදු) | ක්ෂය අනුපාතිකය (%) |
|---|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 20 | 5% |
| යන්ත්‍රෝපකරණ | අවුරුදු 06 මාස 08 | 15% |
| ජල සැපයීමේ උපකරණ | අවුරුදු 06 මාස 08 | 15% |
| රසායනාගාර උපකරණ | අවුරුදු 06 මාස 08 | 15% |
| කාර්යාලීය උපකරණ | අවුරුදු 10 | 10% |
| රථ වාහන | අවුරුදු 05 | 20% |
| ආයුධ හා මෙවලම් | අවුරුදු 03 | 33.33% |

වත්කමක ක්ෂය එය ප්‍රයෝජනයට ගන්නා දිනයේ සිට ගණනය කරන අතර එය විකිණීම සඳහා ඉදිරිපත් කිරීමට වර්ගීකරණය කරන දිනය හෝ වත්කම ඉවත් කරන දිනය යන දෙකින් පලමු දිනයේදී ක්ෂය කිරීම නවතනු ලැබේ.

### 7.3 නොනිමි වැඩ

වාර්තා කරන දිනය වන විට නොනිමි වැඩ සඳහා වැය වූ ප්‍රාග්ධන වියදම් නොනිමි වැඩ ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා ඇති අතර ප්‍රවර්තන වර්ෂය ඇතුළත වැඩ අවසන් කර ප්‍රයෝජනයට ගත් වත්කම් දේපළ, පිරියත සහ උපකරණ යටතේ පෙන්වා ඇත.

## 8. මූල්‍ය වත්කම්

සංස්ථාව මූල්‍ය වත්කම් පහත දැක්වෙන ආකාරයට වර්ගීකරණය කර ඇත. ලාභ හෝ අලාභ මගින් මූල්‍ය වත්කම් සාධාරණ අගයට, ණය සහ ලැබිය යුතු දෑ, විකිණීම සඳහා ඇති මූල්‍ය වත්කම් සහ පරිණත වීම තෙක් තබාගන්නා ආයෝජන යනුවෙනි. මූල්‍ය වත්කම අත්පත් කරගන්නා අරමුණ මත වර්ගීකරණය රඳා පවතියි. වාර්තා කරන කාලපරිච්ඡේදයේ සහ වාර්තා කරන දිනට සංස්ථාව සතුව ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද මූල්‍ය වත්කම් කිසිවක් නොමැත. සියලුම මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට, ගණුදෙනු පිරිවැය එකතු කර හඳුනාගෙන ඇත.

## 9. තොග

තොගය දක්වා ඇත්තේ පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි යන දෙකෙන් අඩු අගය පදනම් කරගෙනය. තොගවල පිරිවැය ලෙස දක්වා ඇත්තේ තොග මිලදී ගැනීමේ පිරිවැය, තොග වෙන් කිරීමේ පිරිවැය (පරිවර්තන පිරිවැය) හා පවතින තොග වර්තමාන භාවිතයට දැරූ වියදම්ය.

## 10. වෙළඳ ණයගැතියෝ

සංස්ථාව විසින් වෙළඳ ණයගැතියන් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා ගෙන ඇත්තේ සංස්ථාවට මුදල් හෝ වෙනත් මූල්‍යමය වත්කමක් ලැබීමට ගිවිසුම් ගත හිමිකමක් ඇත්නම් පමණකි.

## 11. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ ලෙස නිර්වචනය කර ඇත්තේ අත ඇති මුදල්, බැංකු ජංගම ගිණුම් ශේෂ සහ ඉහල ද්‍රවශීලීත්වයකින් යුතු කෙටි කාලීන තැන්පතුය. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වන්නේ අත ඇති මුදල්, සහ බැංකු තැන්පතුය.

## 12. වගකීම් සහ වෙන්කිරීම්

වාර්තා කරන දිනයේ සිට වර්ෂයක් ඇතුළත ඉල්ලා සිටි අවස්ථාවක ගෙවිය යුතු ගෙවීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වගකීම් යටතේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. ජංගම නොවන වගකීම් යනු වාර්තා කරන දිනයේ සිට වර්ෂයකට වැඩි කාලයකදී ගෙවිය යුතු ශේෂ වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී හඳුනා ගත් සියලුම වගකීම් ගිණුම් ගත කර ඇත.

වෙන් කිරීමක් හඳුනා ගෙන ඇත්තේ අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සංස්ථාවට විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි සම්මුතික හෝ නීතිමය බැඳීමක් තිබෙන අවස්ථාවක එම බැඳීම පියවීමට ආර්ථික ප්‍රතිලාභයක් ගෙවීමට සම්භාවිතාවක් ඇති අවස්ථාවකදීය.

**13. මහා භාණ්ඩාගාරයේ දායකත්වය**

ප්‍රාග්ධන වත්කම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු සියලුම මුදල් සමුච්චිත අරමුදලෙහි දක්වා ඇත.

**14. ණය ගැණුම්**

ණයට ගැණුම් සාධාරණ වටිනාකමින් ගණුදෙනු පිරිවැය අඩුකර මුලින් හඳුනාගෙන ඇත. ණය ගැණුම් වල ධාරණ අගය වන්නේ ක්‍රමක්ෂය කළ පිරිවැයයි.

**15. සේවක විශ්‍රාම ප්‍රතිලාභ**

**නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්**

සංස්ථාව විසින් සුදුසුකම් ලබා ඇති සියලුම සේවකයන් වෙනුවෙන් 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනතෙහි නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ගෙවයි. ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අංක 19, සේවක ප්‍රතිලාභ, ප්‍රමිතයෙහි නිර්දේශ කර ඇති පරිදි සංස්ථාව විසින් නිර්වචිත ප්‍රතිලාභ, ප්‍රක්ෂේපිත ඒකක ප්‍රතිලාභ ක්‍රමය අනුව වාර්ෂිකව ගණනය කර ඇත.

**16. ආදායම් හඳුනාගැනීම**

මුදල් ලැබෙන දිනය නොසලකා සංස්ථාවට ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ සම්භාවිතාව සහ ආදායම විශ්වාසනීය ලෙස මැනිය හැකි ප්‍රමාණය තෙක් සංස්ථාව විසින් ආදායම් හඳුනා ගනියි.

**17. පුනරාවර්තන වියදම් හඳුනා ගැනීම**

විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයෙහි වියදම් හඳුනාගෙන ඇත්තේ නිශ්චිත ආදායමක් උපයාගැනීම සහ ඒ සඳහා වැය වන පිරිවැය අතර ඍජු සම්බන්ධතාවය පදනම් කරගෙනය. ව්‍යාපාරය පවත්වා ගෙන යාමට සහ ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම තත්ත්වයෙන් පවත්වා ගෙන යාමට වැය කළ සියලුම පිරිවැය ප්‍රවර්තන වර්ෂයේ ලාභය ගණනය කිරීමේදී බැර කර ඇත.

**18. ආදායම් බදු**

ආදායම් බදු වියදම යටතේ ප්‍රවර්තන වර්ෂයේ ගෙවිය යුතු බදු සහ විලම්බිත බදු ඇතුළත්ය.

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**
**2014.12.31 දිනට**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| | 31.12.2014 | 31.12.2013 |
|---|---|---|
| **වත්කම්** | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්** | | |
| දේපල, පිරියත හා උපකරණ | 166,665,141.88 | 155,081,533.27 |
| නෙනිමි වැඩ | 87,101,726.50 | 71,492,032.38 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | | |
| සේවක ණය | 10,027,082.56 | 7,555,483.69 |
| විලම්භිත බදු | 6,334,189.19 | 9,876,643.19 |
| | 270,128,140.13 | 244,005,692.53 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 130,583,741.83 | 144,256,841.12 |
| මාර්ගස්ථ තොගය | - | 2,869,330.42 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | | |
| සේවක ණය | 7,361,199.87 | 10,404,303.21 |
| රත්‍රං තොගය | 3,912,464.55 | 5,561,695.00 |
| මාජින් ගිණුම | 2,500,000.00 | 3,874,335.00 |
| අනේවාසික විදේශ විනිමය | 738,617.09 | 715,192.62 |
| විවිධ තැන්පත් | 1,131,002.00 | 3,397,502.00 |
| ස්ථාවර තැන්පතු (කෙටිකාලීන) | 75,168,240.02 | 71,577,603.50 |
| වෙළඳ ණයගැතියෝ | 47,639,250.95 | 86,767,038.00 |
| කලින් ගෙවීම් හා අත්තිකාරම් | 9,737,553.43 | 11,976,280.28 |
| බැංකු ශේෂය | 178,148,339.93 | 38,443,990.32 |
| | 456,920,409.67 | 379,844,111.47 |
| **මුළු වත්කම්** | 727,048,549.80 | 623,849,804.00 |
| **ස්කන්ධය හා බැරකම්** | | |
| **ස්කන්ධය** | | |
| දායක ප්‍රාග්ධනය | 5,000,000.00 | 5,000,000.00 |
| | 5,000,000.00 | 5,000,000.00 |
| **බාහිර ස්කන්ධය** | | |
| **මහාභාණ්ඩාගාරය** | 338,038,210.00 | 238,038,210.00 |
| **ලෝක සෞඛ්‍ය සංවිධානය** | 3,994,341.00 | 3,994,341.00 |
| **ආයුර්වේද පර්යේෂණායතනය** | 761,274.00 | 761,274.00 |
| | 342,793,825.00 | 242,793,825.00 |
| **සංචිත** | | |
| ප්‍රාග්ධන සංචිත | 1,923,741.00 | 1,923,741.00 |
| ප්‍රත්‍යාගණන ලාභය | 3,873,559.55 | 5,522,790.00 |
| විදේශ විනිමය සමකිරීමේ සංචිතය | 19,523.00 | 19,523.00 |
| පෙර වර්ෂයේ ගැලපුම් (පැකේජය අනුව) | 38,613,358.30 | 38,613,358.47 |
| අනෙකුත් විස්තීරණ ලාභ | - | 2,751,742.08 |
| ලාභලාභ ගිණුමේ ශේෂය | 193,492,205.00 | 191,546,841.94 |
| | 237,922,386.85 | 240,377,996.49 |
| | 585,716,211.85 | 488,171,821.49 |
| **වගකීම්** | | |
| **ජංගම නොවන වගකීම්** | | |
| ප්‍රතිපාදන සඳහා වෙන්කිරීම් | 5,120,601.00 | 4,193,014.00 |
| බැංකු ණය | 52,000,000.08 | 56,000,000.00 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 35,018,906.40 | 25,300,199.27 |
| | 92,139,507.48 | 85,493,213.27 |
| **ජංගම වගකීම්** | | |
| වෙළඳ ණයහිමියෝ | 13,953,955.51 | 12,069,275.00 |
| ඉදිරි වර්ෂයට ලැබීම් | 441,000.00 | 417,585.00 |
| උපචිත වියදම් | 12,602,193.45 | 11,736,530.24 |
| ටෙන්ඩර් ඇප තැන්පත් | 5,970,978.52 | 2,929,197.00 |
| ගෙවිය යුතු තැන්පත් | 220,216.69 | 185,361.00 |
| ගෙවිය යුතු සේවක ඇප තැන්පත් | 222,813.30 | 212,813.00 |
| ආදායම් බදු ප්‍රතිපාදන | 15,781,673.00 | 22,634,008.00 |
| | 49,192,830.47 | 50,184,769.24 |
| **මුළු ස්කන්ධය හා බැරකම්** | 727,048,549.80 | 623,849,804.00 |

# ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## නිෂ්පාදන ගිණුම

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| <u>අමුද්‍රව්‍ය පරිභෝජනය</u> | | |
| ආරම්භක තොගය | 51,129,741.00 | 68,058,659.00 |
| එකතු කළා :- ගැණුම් | 159,964,933.47 | 136,605,366.00 |
| ගැණුම් ආනයන | 147,195.03 | 384,546.00 |
| | 211,241,869.50 | 205,048,571.00 |
| අඩුකළා :- තොග හානි | - | - |
| | 211,241,869.50 | 205,048,571.00 |
| අඩුකළා :- අවසාන තොගය | 44,883,359.41 | 51,129,741.00 |
| **පරිභෝජනය කළ අමුද්‍රව්‍ය පිරිවැය** | 166,358,510.09 | 153,918,830.00 |
| <u>ඇසුරුම් ද්‍රව්‍ය පරිභෝජනය</u> | | |
| ආරම්භක තොගය | 10,684,760.00 | 11,357,499.00 |
| එකතු කළා :- ගැණුම් | 23,118,100.75 | 22,242,376.00 |
| | 33,802,860.75 | 33,599,875.00 |
| අඩුකළා :- අවසාන තොගය | 7,845,074.58 | 10,684,760.00 |
| **පරිභෝජනය කළ ඇසුරුම් ද්‍රව්‍ය පිරිවැය** | 25,957,786.17 | 22,915,115.00 |
| සෘජු ශ්‍රම වියදම් | 53,290,111.68 | 49,705,875.01 |
| ආරම්භක දැව්තෙල් තොග | 252,000.00 | 762,190.00 |
| වෙනත් සෘජු වියදම් | 15,233,764.92 | 13,571,920.00 |
| අඩුකළා :- අවසාන දැව්තෙල් තොග | 969,076.00 | 252,000.00 |
| | 67,806,800.60 | 63,787,985.01 |
| **ප්‍රාථමික පිරිවැය** | 260,123,096.86 | 240,621,930.01 |
| <u>**කම්හල් පොදුකාර්යය පිරිවැය**</u> | | |
| එකතුකළා :- ආරම්භක නොනිමි | 9,071,213.00 | 6,251,170.26 |
| වක්‍ර වියදම් | 39,171,394.44 | 40,843,311.63 |
| අඩුකළා :- අවසාන නොනිමි | 12,646,762.39 | 9,071,213.00 |
| | 35,595,845.05 | 38,023,268.89 |
| **වර්ෂයේ මුළු නිෂ්පාදන පිරිවැය වෙළඳ ගිණුමට ගෙන ගියා** | 295,718,941.91 | 278,645,198.90 |

## ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
## 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| විකුණුම් | 444,941,698.49 | 425,450,179.00 |
| අඩුකළා :- විකුණුම් පිරිවැය | 304,892,030.07 | 265,720,560.15 |
| **දළ ලාභය** | 140,049,668.42 | 159,729,618.85 |
| වෙනත් ආදායම් | 8,621,577.31 | 12,611,164.82 |
| | 148,671,245.73 | 172,340,783.67 |
| අඩුකළා :- ආයතන හා පරිපාලන වියදම් | 82,300,046.44 | 77,822,750.63 |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | 48,547,895.94 | 49,558,421.16 |
| | 130,847,942.38 | 127,381,171.79 |
| **ක්‍රියාකාරකම් වලින් ලද ලාභය** | 17,823,303.35 | 44,959,611.88 |
| ශුද්ධ මූල්‍ය ආදායම/ වියදම | (3,349,279.74) | (2,703,943.46) |
| බදු අඩුකිරීමට පෙර ලාභය | 14,474,023.61 | 42,255,668.42 |
| අඩුකළා :- ලාභය මත බදු වෙන්කිරීම් | 6,505,596.00 | 13,000,187.92 |
| **බදු පසු ශුද්ධ ලාභය** | 7,968,427.61 | 29,255,480.50 |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම්** | | |
| පාරිතෝෂික ආයුගණන ලාභය/(ආලාභය) | (6,139,731.80) | (343,088.80) |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම්** | (6,139,731.80) | (343,088.80) |
| **වර්ෂයේ ලාභය** | 1,828,695.81 | 28,912,391.70 |

**ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව**
**2014.12.31 න් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| **<u>මෙහෙයුම් කටයුතු</u>** | | |
| බදුපෙර ලාභය | 14,474,023.61 | 42,255,668.42 |
| **<u>ගැලපීම්</u>** | | |
| විවිධ වෙන්කිරීම් | 927,587.00 | 701,700.00 |
| වත්කම් ක්ෂයවීම් | 10,010,368.65 | 11,765,787.23 |
| ගොඩනැගිලි ඉවත් කිරීමේ අලාභය | - | - |
| ශුද්ධ මෙහෙයුම් නොවන ආදායම් | - | (3,762,925.00) |
| පාරිතෝෂික දීමනා ගැලපීම් | 4,116,710.33 | 3,301,569.39 |
| පෙර වර්ෂයේ ගැලපීම් | 49,448.17 | |
| රත්‍රං ප්‍රත්‍යාගණනය | - | - |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර ලාභය** | 29,578,137.76 | 54,261,800.04 |
| **<u>කාරක ප්‍රාග්ධන වෙනස්වීම</u>** | | |
| තොග (වැඩිවීම) / අඩු විම | 13,673,099.29 | (2,991,042.89) |
| මාර්ගස්ථ තොග (වැඩිවීම) /අඩු විම | 2,869,330.42 | (1,815,777.75) |
| සේවක ණය (වැඩිවීම) / අඩු විම | 571,504.47 | (1,430,773.24) |
| කළින් ගෙවීම් හා අත්තිකාරම් (වැඩිවීම) /අඩු විම | 2,238,726.85 | 9,391,998.39 |
| විවිධ තැන්පත් (වැඩිවීම) / අඩු විම | 2,266,500.00 | 136,500.00 |
| ණයගැතියෝ (වැඩිවීම) / අඩු විම | 39,127,787.05 | (19,040,844.00) |
| ණයහිමියෝ වැඩිවීම / (අඩු විම) | 1,884,680.51 | 9,486,357.00 |
| ගිණුම්කරණ පැකේජයේ වෙනස වැඩිවීම / (අඩු විම) | (0.17) | 1,078,072.87 |
| ඉදිරි වර්ෂයට ලැබීම් වැඩිවීම / (අඩු විම) | 23,415.00 | 253,585.00 |
| ටෙන්ඩර් ඇප තැන්පත් වැඩිවීම / (අඩු විම) | 3,041,781.52 | (104,365.00) |
| ගෙවිය යුතු තැන්පත් වැඩිවීම / (අඩු විම) | 34,855.69 | (17,800.00) |
| ගෙවිය යුතු සේවක ඇප තැන්පත් වැඩිවීම / (අඩු විම) | 10,000.30 | 6,000.00 |
| උපචිත වියදම් වැඩිවීම / (අඩු විම) | 865,663.21 | 259,852.26 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමෙන් පසු මෙහෙයුම් ලාභය** | 96,185,481.90 | 49,473,562.68 |
| අඩුකළා :- පාරිතෝෂික දීමනා ගෙවීම | (537,735.00) | (1,069,500.00) |
| බදු ගෙවීම | (12,500,000.00) | (2,000,000.00) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | 83,147,746.90 | 46,404,062.68 |
| **<u>ආයෝජන කටයුතු</u>** | | |
| ස්ථාවර වත්කම් වෙනස් වීම | (21,593,977.26) | (5,939,779.07) |
| නෙනිමි වැඩ වෙනස් වීම | (15,609,694.12) | (41,794,268.47) |
| ස්ථාවර තැන්පතු වෙනස් වීම | (3,590,636.52) | (4,876,579.15) |
| මාජින් ගිණුමේ වෙනස් වීම | 1,374,335.00 | (2,642,088.00) |
| අනේවාසික විදේශ විනිමය ගිණුමේ වෙනස් වීම | (23,424.47) | (36,436.03) |
| **අයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | (39,443,397.37) | (55,289,150.72) |
| **<u>මූල්‍ය කටයුතු</u>** | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන | 100,000,000.00 | 3,000,000.00 |
| බැංකු ණය, පොළී ආපසු අයකර ගැනීම | (3,999,999.92) | (4,000,000.00) |
| **මූල්‍ය කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | 96,000,000.08 | (1,000,000.00) |
| මුදල් හා මුදල් හා සමාන දෑ අතර ශුද්ධ වෙනස් වීම | 139,704,349.61 | (9,885,088.04) |
| **2014.01.01 මුදල් හා මුදල් හා සමාන දෑ** | 38,443,990.32 | 48,329,078.36 |
| **2014.12.31 මුදල් හා මුදල් හා සමාන දෑ** | 178,148,339.93 | 38,443,990.32 |

| | 2014 | 2013 |
|---|---|---|
| | රු. | රු. |
| මහජන බැංකුව - ගංගොඩවිල -ගි.අ . 97100-182315453 | 41,423,221.77 | 15,116,387.58 |
| මහජන බැංකුව - ගංගොඩවිල -ගි.අ . 97100-272315453 | 23,012,460.76 | 5,519,183.66 |
| ලංකා බැංකුව-ආයතන ශාඛාව-ගි.අ .00001209 | 112,992,657.40 | 17,448,419.08 |
| ඉතිරි කිරීමේ ගිණුම | 720,000.00 | 360,000.00 |
| | 178,148,339.93 | 38,443,990.32 |

# 2014 ස්කන්ධය හා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනස්වීම් ප්‍රකාශය
# (STATEMENT OF CHANGES IN EQUITY FOR 2014)

| විස්තරය | දායක ප්‍රග්ධනය (රු.) | මහා භාණ්ඩාගාරය (රු.) | ලෝක සෞඛ්‍ය සංවිධානය (රු.) | අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන (රු.) | ප්‍රාග්ධන සංචිත (රු.) | ප්‍රත්‍යාගණන සංචිත (රු.) | පරිසණක පැකේජය අනුව සංචිතය (රු.) | විදේශ විනිමය සමකිරීමේ සංචිතය (රු.) | ලාභලාභ ගිණුම (රු.) | අනෙකුත් විස්තීරණ ලාභ (රු.) | එකතුව (රු.) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2014.01.01 දිනට ශේෂය | 5,000,000 | 238,038,210 | 3,994,341 | 761,274 | 1,923,741 | 5,522,790 | 38,613,358 | 19,523 | 191,546,842 | 2,751,742 | 488,171,821 |
| වර්ෂය තුල ගැලපීම් | - | 100,000,000 | - | - | - | (1,649,230) | - | - | 1,945,363 | (2,751,742) | 97,544,391 |
| 2014.12.31 දිනට ශේෂය | 5,000,000 | 338,038,210 | 3,994,341 | 761,274 | 1,923,741 | 3,873,560 | 38,613,358 | 19,523 | 193,492,205 | - | 585,716,212 |

## ගිණුම් සටහන් (NOTE TO ACCOUNTS)

1. 2014.12.31 දිනට සංස්ථාවේ තොග තත්වය පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 1. | අමුද්‍රව්‍ය තොගය (පිරිවැය) | රු.44,883,359.41 |
| 2. | නිමි ඖෂධ තොගය (පිරිවැය) | රු.62,379,108.93 |
| 3. | ඇසුරුම් තොගය (පිරිවැය) | රු.7,845,074.58 |
| 4. | නොනිමි තොගය ( පිරිවැය) | රු.12,646,762.39 |
| 5. | ලිපිද්‍රව්‍ය තොගය (පිරිවැය) | රු.1,462,368.27 |
| 6. | දැව්තෙල් තොගය ( පිරිවැය) | රු. 969,076.00 |
| 7. | යන්ත්‍ර අමතර කොටස් තොගය | රු.271,230.00 |
| 8. | සුභසාධන ද්‍රව්‍ය | රු.126,762.25 |

2. 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණන ගාස්තු වශයෙන් රු. 550,000.00 ක ප්‍රතිපාදන වෙන් කර ඇත.

3. 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතට සහ 2011 අංක 22 දරණ දේශීය ආදායම් සංශෝධන පනතට අනුව සංස්ථාවේහි මේහෙයුම් ලාභය 28%ක අනුපාතයකින් ආදායම් බදු වලට යටත් වේ.

| | 2014 (රු.) |
|---|---|
| ප්‍රවර්ථන වර්ෂයේ ලාභය මත බදු | 2,963,142.00 |
| විලම්භිත බදු | 3,542,454.00 |
| | 6,505,596.00 |

4. පහත දැක්වෙන නඩු ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව පාර්ශවකරුවෙකු කරගෙන විභාග වෙමින් පවති.

| පාර්ශවය | තනතුර | නඩු අංකය | අධිකරණය | චෝදනා ස්වභාවය |
|---|---|---|---|---|
| එම්.කේ.සෝමදාස මයා | ගබඩා පාලක | W/P/HCCRMT/78/07 F | ශ්‍රේෂ්ඨාධිකරණය | අවු.55න් විශ්‍රාම යැවීම. |
| එච්.බී.ජයවර්ධන මයා | ගබඩා පාලක | MH/33/1191/2015 | කම්කරු උසාවිය - පන්නිපිටිය | අවු.59 න් විශ්‍රාම යැවීම. |
| ආර්.එම්. ලංකාතිලක මයා | ආරක්ෂක නිලධාරි | HC3755/07 | මහාධිකරණය - කොළඹ | ජංගම අලෙවි මුදල් වංචාව |
| මැච්මා කොච්රන් පුද්.සමාගම | සැපයුම්කරුවෙකි | ARB/229/2013 සහ ARB/1622013 | වාණිජ මහාධිකරණය | ස්ටීම් බොයිලේරුව සැපයීම වෙනුවෙන් ඇති මුදල් |

5. ආනයනික අමුද්‍රව්‍ය හා යන්ත්‍ර අමතර කොටස් ආනයනය කිරීම සඳහා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව හා මහජන බැංකුව ගංගොඩවිල ශාඛාව සමඟ ණයවර ලිපි මඟින් ගිවිසුම් වලට එළඹ ඇත.

6. සංස්ථාවේ රත්‍රං තොගය 2014.12.31 වන දින එවකට පැවති මිල අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යාන්තර ශාඛාවේ තක්සේරුකරු විසින් රු.3,912,464.55 කට තක්සේරු කර ගිණුම් ගත කර ඇත. එහි ඇති ප්‍රකාශිත ලාභය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූලව ප්‍රත්‍යාගත ලාභය ලෙස ගිණුම්වල පෙන්වා ඇත.

7. විකුණුම් වලින් ගිණුම් වල පෙන්නුම් කරනු ලබන්නේ දළ විකුණුම් වලින් වට්ටම් අඩු කළ පසු ශුද්ධ විකුණුම් වේ.

8. ගබඩා අංක 01 / 02 හා අංක 11 ගබඩා වල ඖෂධ නිෂ්පාදනාගාරයක අත්‍යාවශයෙන්ම තිබිය යුතු මිල කල නොහැකි කෞතුක ඖෂධ වර්ග රාශියක් පවතියි. ඒවායේ වටිනාකම ගිණුම් වල ගැලපිම් කර නොමැති අතර ඒකක වශයෙන් 2014.12.31 වන දිනට පහත දැක්වේ.

| | | |
|---|---|---|
| i. | මුතු සිප්පි කිලෝ | 86.35 |
| ii. | මුව අං කිලෝ | 52.10 |
| iii. | කස්තුරි ගුලි | 23.00 |
| iv. | ශුද්ධ කිරිගරුඩ කිලෝ | 4.46 |
| v. | දැලි පොතු කිලෝ | 3.00 |
| vi. | රිදී තුත්තනායගම් කිලෝ | 18.50 |
| vii. | සුදු ඊයම් කිලෝ | 16.80 |
| viii. | පිත්තල තහඩු කිලෝ | 2.50 |

9. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය හා ආයුර්වේද දෙපාර්තමේන්තුවට අයත් ඔසු ගොවි ව්‍යාපෘති කිහිපයක් සංස්ථාවට තාවකාලිකව භාර දී ඇත. ඒවායේ වත්කම් සංස්ථාව තාවකාලිකව භාරගෙන ඇති අතර දැනට ඔසු ගොවි ව්‍යාපෘති සඳහා වැය දැරීම් සංස්ථාව විසින් සිදු කරනු ලබයි. ඒවායේ නිෂ්පාදන සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනය සඳහා යොදාගෙන ඇත.

10. සංස්ථාවෙහි සැපයුම් කළමනාකරු වශයෙන් සේවය කල එස්. එල්. කැකිරිදෙනිය මයා විසින් සංස්ථාවට විරුද්ධව කම්කරු විනිශ්චය සභාවේ පවරා තිබූ නඩුවේ තීන්දුව සංස්ථාවට විරුද්ධව ලැබීම නිසා එම නිලධාරියාට ගෙවිය යුතු වන්දි මුදල වන, රු. 1,587,000.00 ගෙවා ඉතිරි රු.793,500.00ක් චෙක්පතක් මඟින් සංස්ථාව වෙත ලබා දී ඇත.

11. සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනය සඳහා අධිකරණ හා උසාවි වලින් පරිත්‍යාග වශයෙන් ලැබෙන අමුද්‍රව්‍ය, ඒවායේ වටිනාකම පවත්නා වර්ෂයේ ටෙන්ඩර් අවම මිල යටතේ ගණනය කර, සංස්ථාවේ විවිධ ආදායම් ලෙසත් අමුද්‍රව්‍ය ගැණුම් ලෙසත් ගිණුම් වල ගැලපීම් කර ඇත.

12. දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සතුව පවතින LC 9184 දරණ ලොරි රථය සංස්ථාවේ ඖෂධ බෙදා හැරීම සඳහා සේවයේ යොදවා ඇත.